**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2021-02-01 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : පී.ආර්. ලොකුගලප්පත්ති මිය.
අංක : 7/1, උඩැල්තේ පටු මාවත,
බෝවල, මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

**පැමිණිලි අංකය : HRC/K/657/18/- A**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, ඇයගේ තුන්වන දරුවා වන කේෂාන් රනිඳු අබේරත්න යන අය කිංස්වුඩ් විද්‍යාලයේ 2019 වර්ෂයේ පළමු වන වසර සඳහා සඳහා මහ/කිංස්වුඩ් විද්‍යාලයට ඇතුලත් කිරීමේ අපේක්ෂාවෙන් සහෝදර පදනම යටතේ සහ ආසන්න පදිංචිය යටතේ අයදුම්පත් යොමු කළ බවත්, පසුව ඊට අදාළව පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ අභියාචනා පරීක්ෂණ වලදී ඇයගේ දරුවාට සහෝදර පදනම යටතේ පමණක් ලකුණු 34 ක් ලබාදී ඇති නමුත්, එහිදී පදිංචිය සඳහා ඊට අදාළ සහ අනෙකුත් ලේඛන වලට ලකුණු ලබාදී නොමැති බවයි. එසේම ඇයගේ පළමු දරුවන් දෙදෙනාම ඉහත ලිපි ලේඛන මත මෙම පාසලට ඇතුලත් කර, මේවනවිට මෙම පාසලේම ඉගෙනුම ලබන බවත්, මෙම දරුවා පමණක් එම ලේඛන වලට අදාළව පළමු වසරට ඇතුලත් කිරීම සඳහා ලකුණු ලබානොදීම හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති නිදහස් අධ්‍යාපනය ලැබීමට හිමි තම දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත්, ඒ සඳහා සාධාරණයක් ඉටු කර දෙන ලෙසත් පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ඇයගේ උප්පැන්න සහතිකයේ මවගේ නම සඳහන්ව ඇත්තේ, පී.පී.එස්. ද සිල්වා වශයෙන් බවත්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති බදු අනුමත ලිපියේ හිමිකරු ලෙස සටහන්ව ඇත්තේ, පී.සී.එච්.එස්.ගලප්පත්ති වශයෙන් බවත්, ඒ අනුව




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

පැමිණිලිකාරියගේ නම වෙනස් නිසා එය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී පිළිගෙන නොමැති බවත්, එම නිසා ලකුණු ලබාදී නොමැති බවත් සඳහන් කර ඇත. පැමිණිලිකාරිය පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති ලියවිල්ලේද පෙර කී නම වන පී.පී.එස්. ද සිල්වා වශයෙන් ද සඳහන්ව ඇති බවත්, ඒ අනුව අභියාචනා පරීක්ෂණයේදී ද ලකුණු වල වෙනසක් වී නොමැති බවත් දන්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාර පොලිනි රන්ජනිකා ලොකු ගලප්පත්ති යන අය තම දරුවා වන එන්.පී.කේ.රතිඳු අබේරත්න යන දරුවා 2019 පළමු වසරට ඇතුළත් කිරීම සඳහා සහෝදර හා ආසන්න පදිංචිය මත මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට අයදුම්පත යොමු කර ඇත.

ඊට අදාළව පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ වලදී හා අභියාචනා පරීක්ෂණ වලදී පැමිණිලිකරු පදිංචි ඉඩම ඇයගේ මවගේ නමින් ඇති අතර, එම දීර්ඝ කාලීන බදු අනුමැතියෙහි නමෙහි ඇති වෙනස නිසා පදිංචියට ලකුණු ලබාදී නොමැති බව නිරීක්ෂණය වේ. විවාහයට තම ස්වාමියාගේ නමෙහි කොටසක් භාවිතා කිරීමට නීතිමය බාධාවක් නොමැත.

සහෝදර පදනම මත (BR/28) ලකුණු 34 ක් ලබාදී ඇති අතර, ඉදිරිපත් කර ඇති ප්‍රධාන ලේඛන වලින් පදිංචිය සනාථ නොවන නිසා අනෙකුත් ලකුණු දීම ප්‍රතික්ෂේප කර ඇති බවට වගඋත්තරකාර පාර්ශවය 2018.12.19 සහ 2020.01.09 දිනැති ලිපි වලින් නිරීක්ෂණය වේ.

2019.10.28 දින පැවති මූලික පරීක්ෂණයේදී මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති ප්‍රකාශ කර ඇත්තේ, පදිංචිය සනාථ කරන ප්‍රධාන ලේඛන පිළිනොගත් බැවින් ලකුණු ලබානොදුන් බවයි. මේ සම්බන්ධ පැමිණිලි පාර්ශවීය විරෝධතා ගොනු කර ඇත.

❖ **සහෝදර පදනම මත ලැබූ ලකුණු (BR/28)**

| | විස්තරය | අයදුම්කරුට ලැබිය යුතු ලකුණු | ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ලද ලකුණු |
|---|---|---|---|
| i | දැනට පාසලේ ඉගෙනුම ලබන සහෝදරයින් (20) | 20 | 34 |
| ii | සහෝදරයා පළමු ශ්‍රේණියට ඇතුළත්ව ඉගෙනුම ලැබීම (05) | 5 | |
| iii | සහෝදරයින් දෙදෙනෙකුට වඩා ඉගෙනුම ලැබීම (05) | 5 | |
| iv | සහෝදරයින් පාසලට ලබාදී ඇති ජයග්‍රහණ (10) | 4 | |
| v | පදිංචිය තහවුරු කෙරෙන ප්‍රධාන ලේඛන (10) | 6 | 00 |

| | | | |
|---|---|---|---|
| vi | ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය (20) | 20 | 00 |
| vii | පාසලට ඇති ආසන්නතාවය (30) | 26 | 00 |
| | එකතුව | 86 | 34 |

ඒ අනුව සහෝදර පදනම මත පැමිණිලිකරුට ලැබිය යුතු ලකුණු ප්‍රමාණය ලකුණු 86 කි. එම ලකුණු කඩඉම් ලකුණු 55 සීමාව ඉක්මවා ඇත.

❖ ආසන්න පදිංචියට ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත. CO/265 ආසන්න පදිංචියට ලැබිය යුතු ලකුණු පහත සටහනෙහි දක්වා ඇත. ඒ අනුව ද සලකා බලන කල ලැබිය යුතු ලකුණු අවම සීමාව වන ලකුණු 87 ඉක්මවනු ඇත.

| | විස්තරය | අයදුම්කරුට ලැබිය යුතු ලකුණු |
|---|---|---|
| i | ඔප්පුවට (30) | 23 |
| ii | ඡන්ද හිමි නාමලේඛනයට (25) | 25 |
| iii | අතිරේක ලේඛන (05) | 4 |
| iv | ආසන්නතාවය (40) | 36 |
| | එකතුව | 88 |

සැලකිල්ලට ලක්වූ ලේඛන :-

1. පැමිණිලි පාර්ශවීය මවගේ ජාතික හැඳුනුම්පත, විවාහ සහතිකය
   විවාහයට පෙර නම - ගාර්දිගේ පුංචිහේවා සුමනා ද සිල්වා
   විවාහයට පසු නම - ගාර්දිගේ පුංචිහ්වාගේ සුමනා ද ගලප්පත්ති

2. බදු ඔප්පුවේ පිටපත හා සංශෝධිත නම ඇතුළත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව නිකුත් කරන 2001.09.28 දිනැති ලිපිය

3. දැනට වගඋත්තර පාර්ශවීය පාසලේ ඉගෙනුම ලබන වැඩිමහල් සොහොයුරන් දෙදෙනාගේ තොරතුරු

මෙම පැමිණිලි පාර්ශවයට සහෝදර ගණය යටතේ ලබාදෙන ලකුණු සහ ආසන්නතා පදනම මත පිහිටා පදිංචියට ලකුණු ලබාදීමෙන් ලකුණු සංඛ්‍යාව සම්පූර්ණ කර ගත හැකිය. ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා මෙම විද්‍යාලයට ඇතුලත් වීමට සහෝදර හා ආසන්න පදිංචිය යන දෙකටම සුදුසුකම් ඇති නමුත්, සහෝදර පදනම මත වැඩි සුදුසුකම් සපුරා ඇති බවට නිරීක්ෂණය කළ හැකිය.

**නිගමනය :-**

උක්ත කරුණු සියල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැමිණිලිකාරියගේ දරුවාට වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමිවීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

චක්‍රලේඛනයට අනුව පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති අදාල ලේඛන වලට ලකුණු ලබාදිය යුතු අතර. ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතලත් කර ගැනීමට කටයුතු කල යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

2021. [illegible] වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anushya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

B/R